# මුල් බුදු සමයේ සඳහන් ව්‍යාධි ප්‍රතිශේධනාත්මක විධි

# Preventive Methods of Infirmities Mentioned in Early Buddhism

**S. P. Molligoda**[1]

ව්‍යාධි ප්‍රතිශේධනාත්මක විධි ලෙස සලකනු ලබන්නේ රෝගවලින් වැළකී සිටීම සඳහා අනුගමනය කළ යුතු උපාය මාර්ගයි. රෝග සඳහා ඖෂධ යෙදීමට වඩා වැදගත් වන්නේ රෝගවලින් විනිර්මුක්තව ජීවත් වීම සඳහා අවශ්‍ය වටපිටාව සකසා ගැනීම බව මුල් බුදු සමයේ සඳහන් කරුණුවලින් බුදුන් වහන්සේ විසින් පෙන්වා දී ඇත. බටහිර වෛද්‍ය විද්‍යාව හා ආයුර්වේද වෛද්‍ය විද්‍යාව අද ලෝකයම පිළිගත් ප්‍රධාන වෛද්‍ය ක්‍රම දෙක බවට පත්ව තිබේ. බටහිර වෛද්‍යවිද්‍යාව රෝගවලින් වැළකී සිටීමට වඩා රෝග සුව කිරීම පිළිබඳ විශේෂ අවධානයක් දක්වා ඇති බව එම ශාස්ත්‍රය පිළිබඳව අධ්‍යයනය කිරීමෙන් පෙනී යයි. ආයුර්වේද වෛද්‍ය විද්‍යාව රෝග සුව කිරීමට වඩා රෝගවලින් වැළකී සිටීම වඩාත් ප්‍රායෝගික හා ඵලදායි විධි ක්‍රමය බව පෙන්වා දෙයි. නමුත් මුල් බුදු සමයේ අන්තර්ගත ව්‍යාධි ප්‍රතිශේධනාත්මක කරුණු පිළිබඳ ඉතා සූක්ෂම ලෙස නිරීක්ෂණය කිරීමෙන් පෙනී යන්නේ බුදුරජාණන් වහන්සේ විසින් ව්‍යාධි ප්‍රතිශේධනාත්මක ක්‍රම දක්වා ඇත්තේ ඉතා සියුම්ව හා ගැඹුරින් අධ්‍යයනය කිරීමෙන් අනතුරුව බවත්, එම ක්‍රම පිළිපැදීමෙන් සුවිශාල පරාසයක් තුළ රෝගවලින් වැලකී සිටීමේ ස්වභාවික ආවරණයක් සැකසෙන බවත් ය. මෙම අධ්‍යයනයේ දී මතු වූ ගැටළුව වූයේ මූලික බුදු සමයේ අන්තර්ගත එනම්, ප්‍රතිශේධනාත්මක කරුණු රෝගවලින් වැළකී සිටීම උදෙසා කෙසේ ඉවහල් වේද යන්නයි. මෙම පර්යේෂණ කාර්ය සඳහා දත්ත රැස් කරන ලද්දේ විනය හා සූත්‍ර පිටකයන් අනුසාරයෙනි.

මෙම අධ්‍යයනයෙන් ලබා ගත් දත්ත විශ්ලේෂණය කිරීමෙන් පෙනී යන්නේ මුල් බුදු සමයේ අන්තර්ගත ව්‍යාධි ප්‍රතිශේධනාත්මක ක්‍රම අනුගමනය කිරීමෙන් බෝවන රෝග මෙන්ම, බෝ නොවන රෝග විශාල ප්‍රමාණයකින් ආරක්ෂා වීමට හැකි බවයි. උදාහරණ ලෙස මුල් බුදු සමයේ සඳහන් වැසිකිළි නිර්මාණ හා ඒ ආශ්‍රිතව ලබා දී ඇති උපදෙස් පිළිපැදීමෙන් මූත්‍ර කෘච්ඡ්‍ර, අර්ශස් වැනි රෝග ඉතා පහසුවෙන් වළකා ගැනීමට හැකි බව පෙන්වා දිය හැකියි.

ප්‍රමුඛ පදඃ ව්‍යාධි ප්‍රතිශේධනය, ආයුර්වේද, අර්ශස්, මූත්‍ර කෘච්ඡ්‍ර

**Keywords:** Infirmities, Ayurveda, Hemorrhoids, Urinal Problems

---

Senior lecturer, Institute of Indigenous Medicine, University of Colombo, susanthamolligoda@gmail.com